
# 19 සන්ධි

**කිසියම් කාර්යයක් කිරීමේ දී වඩාත් පහසු මං සෙවීම මනුෂ්‍ය ස්වභාවය යි. භාෂා භාවිතයේ දී ද මේ ධර්මතාව බල පවත්වයි. ශබ්ද උච්චාරණයේ දී ඇතැම් ශබ්ද ඉවත් වී වෙනත් ශබ්ද පිවිසීමත් ඇතැම් ශබ්දවල ස්වරූපය වෙනස් වීමත් දැක ගත හැකි ය. මෙය නිරායාසයෙන් සිදු වන්නකි. මෙයින් භාෂා භාවිතය පහසු ද අලංකාරවත් ද සුමට ද වෙයි. ව්‍යාකරණයේ දී 'සන්ධි' යනුවෙන් හැඳින්වෙනුයේ උච්චාරණයේ පහසුව සඳහා සිදු වන ශබ්ද ගැළපීමේ ක්‍රමයකි.**

මෙලෙස ශබ්ද සංවිධානයේ දී ද අපි විවිධ ක්‍රමවලින් ඒවා එකතු කරමු. එලෙස එකතු කිරීම නිසා,




- ★ උච්චාරණ පහසුව ඇති වේ.
- ★ ශබ්ද කෙටි වීම සිදු වේ.
- ★ භාෂාවේ ව්‍යක්ත භාවයක් ඇති වේ.

දිය පහරක් ගලා යන මාර්ගයෙහි ඊට බාධක වන ගල් පර, වළවල්, මුල් ආදිය වෙයි ඒවා ඉවත් කිරීමෙන් දිය පහර පහසුවෙන් ගලා යයි. එමෙන් ම ශබ්ද උච්චාරණයට බාධා කෙරෙන ශබ්ද බැහැර කිරීමෙන්, අලුත් ශබ්ද එක් කිරීමෙන් හා ඇතැම් ශබ්දවල ස්වරූපය වෙනස් කිරීමෙන් පහසුවෙන් උච්චාරණය කිරීමට අවකාශය සැලසේ.

භාෂා භාවිතයේ දී පහසු භාවිතයට බාධක වන අංග ඉවත් කිරීම, අභිනව අංග පිවිසීම හා පවත්නා ශබ්දයක ස්වරූපය වෙනස් වීම සන්ධි කිරීම යනුවෙන් හැඳින්වෙයි. මෙවැනි සන්ධි විධි කීපයකි.

**ශබ්දයක් හෝ ශබ්ද කීපයක් ඉවත් කිරීම ලෝපය යි.**

ගුරු + උතුමා - ගුරුතුමා

**පවතින ශබ්දයක් වෙනුවට වෙනත් ශබ්දයක් පැමිණවීම ආදේශය යි.**

දඬ + කම් - දඬයම්

**පවතින ශබ්ද අතරට අලුත් ශබ්දයක් එක් කිරීම ආගමය යි.**

වි + අවුල් - වියවුල්

සන්ධි වන්නේ පද දෙකක් අතර බව මේ අනුව පැහැදිලි වෙයි. සන්ධි වූ පද දෙක වෙන් කොට ගැනීම විසන්ධිය වේ. සන්ධි වූ පදයක අර්ථය වටහා ගැනීමට විසන්ධිය උපකාරී වේ. විසන්ධියෙහි විවිධ රටා හඳුනා ගත හැකි ය.

**ව්‍යඤ්ජනාක්ෂරයකින් කෙළවර වී ස්වරයකින් ආරම්භ වන ශබ්ද**

අතින් +අත - අතිනත
මල් +අත්ත - මල්ලත්ත
මිනිස් + ආ - මිනිසා

**ස්වරයකින් කෙළවර වී ස්වරයකින් ආරම්භ වන ශබ්ද**

ගුණ +අගුණ - ගුණාගුණ
යන +එන - යනෙන
වැලි + අම්පිටිය - වැල්ලම්පිටිය

**ව්‍යඤ්ජනාක්ෂරයකින් කෙළවර වී ව්‍යඤ්ජනාක්ෂර කිහිපයකින් ආරම්භ වන ශබ්ද**

ගෙත් +කම් - ගෙත්තම්
දුක් + පත් - දුප්පත්
පස් + සිය - පන්සිය

**ස්වරයකින් කෙළවර වී ව්‍යඤ්ජනාක්ෂරයකින් ආරම්භ වන ශබ්ද**

දඬු +කම් - දඬුවම්
ගඟ + දිය - ගංදිය
බුදු + සරණ - බුත්සරණ

මෙලෙස විවිධ අයුරින් සැදෙන සන්ධි වර්ග කීපයකි. සන්ධි වීම් දෙවැදෑරුම් කොට දැක්වෙයි.

## 1. අභ්‍යන්තර සන්ධි

ප්‍රකෘති - ප්‍රත්‍යය අතර හෝ ප්‍රකෘතියක් ඇතුළත හෝ සිදුවන සන්ධි

## 2. බාහිර සන්ධි

ප්‍රකෘති දෙකක් හෝ පද දෙකක් අතර සිදු වන සන්ධි ද , ප්‍රකෘති - ප්‍රත්‍යය ගැන්වීම සඳහා සන්ධි වූ රූපයෙන් මෙන් ම විසන්ධි කළ රූපයෙන් ද ලිවිය හැකි ය.

| උදාහරණ:- සන්ධි වීම් සහිත | සන්ධි රහිත |
|---|---|
| ගුණාගුණ | ගුණ අගුණ |
| මූණ | මුහුණ |
| හද්දවස | හත්දවස |
| ධර්මාවාබෝධය | ධර්ම අවබෝධය |


නොමිලේ බෙදා හැරීම සඳහා ය.


## ස්වරයක් මුල් ව සෑදෙන සන්ධි විධි හතරකි.

1. ස්වර සන්ධිය (සර සඳ)
2. පූර්ව ස්වර ලෝප සන්ධිය (පෙර සර ලොප් සඳ)
3. පර ස්වර ලෝප සන්ධිය (පර සර ලොප් සඳ)
4. ස්වරාදේශ සන්ධිය (සරදෙස් සඳ)

## ව්‍යඤ්ජනාක්ෂරයක් මුල් ව සෑදෙන සන්ධි විධි හයකි.

5. ගාත්‍රාදේශ සන්ධිය (ගතදෙස් සඳ)
6. ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය (ගතකුරු ලොප් සඳ)
7. ආගම සන්ධිය (අගම් සඳ)
8. පූර්ව රූප සන්ධිය (පෙර රූ සඳ)
9. පර රූප සන්ධිය (පර රූ සඳ)
10. ද්විත්ව රූප සන්ධිය (දෙරූ සඳ)

එක් එක් සන්ධිය සිදු වන අයුරු වෙන් වෙන් ව හඳුනා ගනිමු.



## 1. ස්වර සන්ධිය

පද දෙකක මුල් පදයේ අග ඇති ස රහිත ව්‍යඤ්ජන ශබ්දය (හල් අකුර) පසු පදයේ මුල ඇති ස්වරය සමග එක් වීමෙන් මේ සන්ධිය සිදු වේ.

වම්+අත
වම්+අත
ම - හල් අකුරට ස්වරය එක් වීම
වමත - සන්ධි පදය

| | | | |
|---|---|---|---|
| උපන් + උපන් | - උපනුපන් | හිත් + ඇති | - හිතැති |
| වයස් + ඇති | - වයසැති | අතින් + අත | - අතිනත |
| නිල් + උපුල් | - නිලුපුල් | පින් + ඇති | - පිනැති |

- **ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වීම ද මේ සන්ධි විධියෙන් සිදු වේ.**


| | | | |
|---|---|---|---|
| මිනිස් + උන් | - මිනිසුන් | අත් + ඉන් | - අතින් |
| සසුන් + අට | - සසුනට | ගස් + එහි | - ගසෙහි |
| බළල් + උන්ගේ | - බළලුන්ගේ | | |

1.1 **පහත දී ඇති පද සන්ධි කරන්න.**

i. සිහින් + ඉඟ
ii. පින් + ඇත්තෝ
iii. එකින් + එක
iv. ඔවුන් + ඔවුන්
v. පවුල් + එහි

1.2 **පහත දී ඇති පද විසන්ධි කරන්න**

i. පසිඳුරන්
ii. රුවනාර
iii. දහමක්
iv. මලසුන
v. ළඳුනට




## 2. පූර්ව ස්වර ලෝප සන්ධිය

සන්ධි වන පද දෙකෙන් පෙර පදයේ අග ඇති ස්වරය (පූර්ව ස්වරය) ලොප් කර ඉතිරි වන හල් අකුරට පර පදයේ මුල ඇති ස්වරය (පර ස්වරය) එක් කිරීමෙන් ගැළපෙන සන්ධිය පූර්ව ස්වර ලෝප සන්ධිය යි.

දකුණු +අත
දකුණ් +උ +අත - පූර්ව ස්වරය වෙන් කිරීම
දකුණ් +උ +අත - පූර්ව ස්වරය ලොප් කිරීම
දකුණ් +අත - පර ස්වරය එක් කිරීම

ණ

දකුණත - සන්ධි පදය




යන්න + ඕනැ - යන්නෝනැ
ගෙන + ආවා - ගෙනාවා
දින + ඉසුරු - දිනිසුරු
මැද + ඇඟිල්ල - මැදැඟිල්ල
සුර + ඉඳු - සුරිඳු

- **ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වීම ද මේ සන්ධි ක්‍රමයෙන් සිදු වේ.**

සතුරු + ආ - සතුරා
ලකුණු + එන් - ලකුණෙන්
දුර + ඉන් - දුරින්
කළ + ඕ - කළෝ



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

2.1 **පහත දී ඇති පද සන්ධි කරන්න.**

i. පොරණ + ඇඳුරන්
ii. සුළු +ඇඟිල්ල
iii. සුරු + අත
iv. නළු + අඟන
v. හිඟුරු + අල

2.2 **පහත දී ඇති පද විසන්ධි කරන්න.**

i. සියැසින්
ii. නුවනග
iii. දිගා
iv. දිනිඳු
v. අරුණලු



## 3. පර ස්වර ලෝප සන්ධිය

සන්ධි වන පද දෙකෙන් පසු පදයේ මුල ඇති ස්වරය ලොප් කිරීමෙන් ගළපන සන්ධිය පරස්වර ලෝප සන්ධිය යි.

මුනි + උතුමා
මුනි +උ + තුමා - පර ස්වරය ලොප් කිරීම
මුනිතුමා - සන්ධි පදය

මිණි + අබරණ - මිණිබරණ
අනු + අරුත් - අනුරුත්
දිය + ඉති - දියති
පිළි + උතුරු - පිළිතුරු
බුදු + අකුරු - බුදුකුරු

- **ප්‍රකෘති ප්‍රත්‍ය සංයෝගය ද මෙම සන්ධි විධියෙන් ඇතැම් විට සිදු වේ.**


ගුරු +උන් - ගුරුන්
බැති + ඉන් - බැතින්

3.1 **පහත දී ඇති පද සන්ධි කරන්න**

i. පැහැ +ඇති
ii. වියළි + ඉඟුරු
iii. පිළි + උතුරු
iv. මුදලි + ඉඳු
v. සුර + අඟන

3.2 පහත දී ඇති පද විසන්ධි කරන්න.

i. යතිතුමා
ii. කතාන්දරය
iii. පමණක්
iv. උඩල
v. සිහසුන



## 4. ස්වරාදේශ සන්ධිය

සන්ධි වන පද දෙකෙන් පෙර පදයේ අග ස්වරයත් පසු පදයේ මුල ස්වරයත් වෙනුවට වෙනත් ස්වරයක් පැමිණවීමෙන් ස්වරාදේශ සන්ධිය සිදු වේ.

දෙ+ අත

ද් +එ +අත - පූර්ව ස්වර වෙන් කිරීම

ද් +එ+අත - ස්වර දෙක වෙනුවට වෙනත් ස්වරයක් පැමිණවීම

ඇ

ද් +ඇ +ත - ස්වර ව්‍යඤ්ජන සංයෝගය

දැ

දැත - සන්ධි පදය

මහ + ඉසුරු - මහෙසුරු (මෙහෙසුරු)
ඒ + අත - ඇත
වට + උර - වටොර
දෙ + අඟුල් - දැඟුල්

- ප්‍රකෘති - ප්‍රත්‍යය සංයෝගය ද මෙම සන්ධි විධියෙන් සිදු වේ.


බල + ඉන් - බලෙන්
රිය + ඉන් - රියෙන්

4.1 පහත දී ඇති පද සන්ධි කරන්න.

i. මහ + ඉසිකා
ii. මේ + අතින්
iii. කඩුව + ඉන්
iv. දෙ + අවුරුදු
v. රිය + ඉන්

4.2 පහත දී ඇති පද විසන්ධි කරන්න.

i. දැඟුලු
ii. ලඹෝදර
iii. නෝබින
iv. දැවර
v. නැසු



## 5. ගාත්‍රාදේශ සන්ධිය

සන්ධි වන පද දෙකෙහි පවත්නා ගාත්‍රාක්ෂරයක් හෙවත් ව්‍යඤ්ජනාක්ෂරයක් වෙනුවට වෙනත් ගාත්‍රාක්ෂරයක් හෙවත් ව්‍යඤ්ජනාක්ෂරයක් පැමිණවීමෙන් සෑදෙන සන්ධිය ගාත්‍රාදේශ සන්ධිය යි.

| | |
|---|---|
| සිති + කම් | |
| සිති +ක් +අම් | - ගාත්‍රාක්ෂරය වෙන් කිරීම |
| සිති + ය් + අම් | - වෙනත් ගාත්‍රාක්ෂරයක් පැමිණවීම |
| සිති + ය් + අම් | |
| ය | - ස්වර ව්‍යඤ්ජන සංයෝගය |
| සිතියම් | - සන්ධි පදය |

ගාත්‍රාදේශ සන්ධියේ දී පර පදයේ මුල වූ 'ක්' ව්‍යඤ්ජනාක්ෂරය වෙනුවට 'ව්', 'හ්', 'ය්' යන අක්ෂර දෙකෙන් එකක් ද,

ක් > ව් - සිත් + කරු - සිත්වරු
ක් > හ් - දව + කල් - දවහල්
ක් > ය් - ගිනි + කම් - ගිනියම්

පූර්ව පදයේ අග වූ 'බ්', 'ද්' යන ව්‍යඤ්ජනාක්ෂර වෙනුවට 'ප්', 'ත්' යන ව්‍යඤ්ජනාක්ෂර ද,

ද් > ත් - බුදු + සරණ - බුත්සරණ

'ස් වෙනුවට 'න්' හා 'ම්' හෝ 'න්' වෙනුවට 'ං' (අනුස්වාරය) ද ආදේශ කෙරේ.


ස් > න් - පස් + සිල් - පන්සිල්
ම් > ං - දුම් + කොළ - දුංකොළ

**5.1 පහත දැක්වෙන පද සන්ධි කරන්න.**

i. සුදු + බත්
ii. දඩ + කම්
iii. රද් + ගම
iv. පස් + සාළිස්
v. ගොන් + බාන

**5.2 පහත දැක්වෙන පද විසන්ධි කරන්න.**

i. පිරියම්
ii. පන්දහස්
iii. බිලියම්
iv. සුණුවම්
v. සන්නිවේදන



# 6. ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය

'ග','ඹ' යන සඤ්ඤක හෙවත් අර්ධානුනාසික ශබ්ද සැදී ඇත්තේ එක් එක් වර්ගයේ ඝෝෂ අල්පප්‍රාණ ව්‍යඤ්ජනයට පෙරටු ව ඒ ඒ වර්ගයේ වර්ගාන්ත නාසික්‍ය ශබ්දයෙන් අර්ධයක් එක් වීමෙන් සේ සැලකෙයි. ගාත්‍රාක්ෂර ලෝප සන්ධියේ දී සඤ්ඤකයට අදාළ පදාන්ත ඝෝෂ අල්පප්‍රාණය හා එයට එක් වූ ස්වරය ද ලොප් වීමත් එහි වූ නාසික්‍ය අර්ධය පූර්ණ නාසික්‍යය බවට පත් වීමත් සිදු වේ.

කොළොඹ + තොට
කොළො + ම්+ බ් + අ + තොට - අර්ධානුනාසික්‍ය වෙන් කිරීම
කොළො + ් + ~~බ්~~ + තොට - නාසික්‍ය ශබ්දය හා බැඳුණු ඝෝෂ අල්පප්‍රාණ ශබ්දය හා ස්වරය ලොප් කිරීම
↓
ම් - නාසික්‍යය ඉතිරි වෙයි
කොළොම් + තොට - පද එක් කිරීම
කොළොම්තොට - සන්ධි පදය

'ම්' වෙනුවට අනුස්වාරය ද යෙදිය හැකි ය. 'කොළොං තොට' යනුවෙනි.

ගඟ + තෙර - ගංතෙර
මිහිඳු + තලා - මිහින්තලා
ළිඳ + පඩිය - ළිංපඩිය
මඟ + මුළා - මංමුළා
කළඳ + දෙක - කළංදෙක


6.1 **පහත දී ඇති පද සන්ධි කරන්න.**

i. ගඟ + පොළ
ii. වඟු + මුතු
iii. සඟ + මිත්
iv. මුඟු + ඇට
v. අඹ + මල්

6.2 **පහත දී ඇති පද විසන්ධි කරන්න.**

i. වළංදෙක
ii. දංගස
iii. තම්පලා
ii. නෙළුම්මල්
iv. ගංදිය


නොමිලේ බෙදා හැරීම සඳහා ය.



# 7. ආගම සන්ධිය

සන්ධි වන්නා වූ ශබ්ද දෙකක් අතරට අමුතුවෙන් ම අකුරක් පැමිණ සන්ධි වේ නම් එය ආගම සන්ධිය යි.

කිරිමැටි + ආන
කිරිමැටි + ය් + ආන - පද දෙක අතරට ව්‍යඤ්ජනයක් පැමිණීම
කිරිමැටි + ය් + ආන
යා - ස්වර ව්‍යඤ්ජන සංයෝගය
කිරිමැටියාන - සන්ධි පදය

තුනු + අඟ - තුනුවඟ
දෙ + ආකාර - දෙයාකාර
සු + අසු - සූවාසු
පුන + උත්පත්ති - පුනරුත්පත්ති
කටු + අල - කටුවල

- **ප්‍රකෘති - ප්‍රත්‍යය සංයෝග වීම ද මේ සන්ධි විධියෙන් සිදු වේ.**


හෙළ + ඕ - හෙළයෝ
හී + අට - හීයට
වැ + අත් - වැයත්
කවි + ආ - කවියා
වීර + එක් - වීරයෙක්

7.1 **පහත දැක්වෙන පද සන්ධි කරන්න.**

i. දෙ + උර
ii. ගෙ + උයන්
iii. දරු + ඕ
iv. කටු + අත්ත
v. නැව් + ආට

7.2 **පහත දී ඇති පද විසන්ධි කරන්න.**

i. රසිකයාගේ
ii. නළුවෝ
iii. නොයෙන
iv. මියුගුණු
v. දුටුවෙක්



## 8. පූර්ව රූප සන්ධිය

සන්ධි වන පද දෙකෙන් පෙර පදයේ අග ඇති රූපය පර පදයේ මුල ඇති රූපය කරා පැමිණවීමෙන් ගළපන සන්ධිය පූර්ව රූප සන්ධිය යි

| | |
|---|---|
| වත් + හල | |
| වත් + තල | - පෙර රූපය පර රූපයට පැමිණවීම |
| වත් + තල | - පද ගැළපීම |
| වත්තල | - සන්ධි පදය |

කම් + හල - කම්මල    ඇත් + හල - ඇත්තල

විස් + කම් - විස්සම්

- **ප්‍රකෘති - ප්‍රත්‍යය සංයෝගය ද මෙම සන්ධියෙන් සිදු වේ.**

  ගොන් + නු - ගොන්නු    සත් + හු - සත්තු

8.1 **පහත දැක්වෙන පද සන්ධි කර ලියන්න.**

i. සත් + හස    iv. ගෙත් + කම්

ii. මත් + හල    v. ඇත් + හු


iii. සිත් + වරු

8.2 **පහත දැක්වෙන පද විසන්ධි කරන්න.**

i. යක්කල    iv. පරද්දා

ii. විස්සම්    v. බළල්ලු

iii. දක්කා



## 9. පර රූප සන්ධිය

සන්ධි වන පද දෙකෙන් පර පදයේ මුල අකුර පෙර පදයේ අග අකුර කරා පැමිණවීමෙන් සිදු වන සන්ධිය පර රූප සන්ධිය යි.

| | |
|---|---|
| දුක් + පත් | |
| දුක් + පත් | - පර රූපය පෙර රූපයට පැමිණ වීම |
| දුප් + පත් | - පද ගැළපීම |
| දුප්පත් | - සන්ධි පදය |

කොක් + ගල - කොග්ගල
සත් + දිනක් - සද්දිනක්
ඇත් + දෙමට - ඇද්දෙමට


වප් + කඩ - වක්කඩ
අත් + ගලා - අග්ගලා

9.1 **පහත සඳහන් පද සන්ධි කරන්න.**

i. කන් + මුල
ii. රුක් + පා
iii. අත් + සන
iv. ළිප් + ගල
v. සත් + දහය

9.2 **පහත සඳහන් පද විසන්ධි කරන්න.**

i. ලග්ගල
ii. දුග්ගන්නා
iii. අල්ලස්
iv. ගොක්කොළ
v. ඇද්දළ



## 10. ද්විත්ව රූප සන්ධිය

පෙර පදයේ අග ඇති හල් අකුර දෙකක් බවට පත් කිරීමෙන් පසු පර පදයේ මුල ඇති ස්වරය සමග එක් කිරීමෙන් ගළපන සන්ධිය ද්විත්ව රූප සන්ධියයි.

පොත් + අල්මාරිය
පොත් + ත් + අල්මාරිය - හල් අකුර ද්විත්ව කිරීම
පොත් +ත් + අල්මාරිය
ත - ස්වරය සමග එක් කිරීම
පොත්තල්මාරිය - සන්ධි පදය

වල් + ඌරා - වල්ලූරා
මල් + අත්ත - මල්ලත්ත
සල් + උයන - සල්ලුයන

- **ප්‍රකෘති - ප්‍රත්‍යය එක් වීම ද මේ සන්ධි විධියෙන් සිදු වේ.**

උගත් + ඕ - උගත්තෝ
දුන් + එමි - දුන්නෙමි

පෙර පදයේ අග අකුර ස්වරයක් නම් ඒ ස්වරය ලොප් කිරීමෙන් පසු ඉතිරි වන හල් අකුර ද්විත්ව කිරීමෙන් ද මේ සන්ධිය සිදු වේ.

ඉති + අල
ඉත් + ඉ + අල - ස්වරය වෙන් කිරීම
ඉත් + ඉ + අල - ස්වරය ලොප් කිරීම
ඉත් + ත් + අල - ව්‍යඤ්ජන ද්විත්වය
ඉත් + ත් +අල

න - ස්වරය සමග එක් කිරීම
ඉත් + නල - පද ගැළපීම
ඉත්නල - සන්ධි පදය

- **ප්‍රකෘති - ප්‍රත්‍යය ගැන්වීම මේ ක්‍රමයෙන් ද සිදු වේ.**

වැදි + ආ - වැද්දා සුදුසු + අන් - සුදුස්සන්

10.1 **පහත දී ඇති පද සන්ධි කරන්න.**

i. කෙකි + අ
ii. රුක් + අත්තන
iii. පත් + ඉරු
iv. මලු + අ
v. සිගිති + එක්
vi. මල් + උයන
vii. ඇඟිලි + එන්
viii. සුදුසු + ඕ

10.2 **පහත දී ඇති පද විසන්ධි කරන්න.**

i. තැග්ග
ii. කෙක්කෙන්
iii. ගොක්කත්ත
iv. වැල්ලම්පිටිය
v. මුත්තා
vi. හත්තඩිය
vii. අනිත්තෙක
viii. අත්තට

**මෙම සිංහල සන්ධිවලට අමතරව සංස්කෘත භාෂාවෙන් පැමිණි සන්ධි පද නූතන භාවිතය තුළ දක්නට ලැබේ.**

එම සන්ධි පද ද ස්වර හා ව්‍යඤ්ජන අක්ෂර මුල් ව සිදු වනු දක්නට ලැබේ.

★ **පූර්ව ස්වර ලොප් වීමෙන්**

මරණ + ආසන්න - මරණාසන්න
ප්‍රථම + ආධාර - ප්‍රථමාධාර
උක්ත + ආඛ්‍යාත - උක්තාඛ්‍යාත
වන + ඖෂධ - වනෞෂධ

★ **පරස්වරය ලොප් වීමෙන්**

සදා + අනුස්මරණීය - සදානුස්මරණීය
කලා + අංශය - කලාංශය
විද්‍යා + අනුකුල - විද්‍යානුකුල

★ **ස්වරාදේශ විධියෙන්**

අමාත්‍ය + අංශය - අමාත්‍යාංශය
සමාන + අර්ථ - සමානාර්ථ

ගුණ + අගුණ - ගුණාගුණ
බුද්ධි + ඉන්ද්‍රිය - බුද්ධීන්ද්‍රිය
ක්‍රිස්තු + උත්පත්තිය - ක්‍රිස්තුත්පත්තිය
පංච + ඉන්ද්‍රිය - පංචේන්ද්‍රිය
ජාතික + උත්සවය - ජාතිකෝත්සවය
පූජා + උපහාර - පූජෝපහාර

★ **පවත්නා ස්වරයක් වෙනුවට ව්‍යඤ්ජනයක් ආදේශ වීමෙන්,**

**'ඉ' වෙනුවට 'ය්' ආදේශය**

අති + අවශ්‍ය - අත්‍යවශ්‍ය    අති + අලංකාර - අත්‍යලංකාර
ප්‍රීති + උත්සවය - ප්‍රීත්‍යුත්සවය    ජාති + ආලය - ජාත්‍යාලය

**'උ' වෙනුවට 'ව්' ආදේශය**

බහු + අර්ථ - බහ්වර්ථ    හේතු + අර්ථ - හේත්වර්ථ

11.1 **පහත දී ඇති පද සන්ධි කරන්න.**

i. ජන + ආදරය
ii. භාෂා + අනුරාගය
iii. කවි + ඉන්ද්‍ර
iv. ශ්‍රවණ + ඉන්ද්‍රිය
v. පූජා + උත්සව
vi. පිතෘ + අර්ථ
vii. පරම + ආයුෂ
viii. විශේෂ + අංග
ix. ගුරු + උපදේශ
x. වීර + උදාර
xi. අනු + ඊක්ෂ
xii. අති + උදාර

11.2 **පහත දී ඇති පද විසන්ධි කරන්න.**

i. අභ්‍යවකාශ
ii. ජාත්‍යන්ධ
iii. පර්යේෂණ
iv. අරුණෝදය
v. මහෞෂධ
vi. දයානුකම්පාව
vii. සන්ධ්‍යක්ෂර
viii. ගුර්වක්ෂර
ix. අධ්‍යක්ෂ
x. සකලෛශ්වර්ය
xi. අතීන්ද්‍රිය
xi. යථාර්ථය

## අවබෝධය

1. **පහත දී ඇති සන්ධි පද සෑදී ඇති අන්දම අනුව කුමන සන්ධි වර්ගයකට අයත් දැයි ලියා දක්වන්න.**

i. නාටෝචිත
ii. පර්යේෂණ
iii. පොඩියෙකාගෙ
iv. ගිනියම්
v. යන්නෙපා
vi. බතල
vii. රුප්පා
viii. යතිතුමා
ix. ගුරුළිඳු
x. රසිකයා

2. **වැරදි ලෙස සන්ධි කොට ඇති පදයක් ඇතුළත් පද පේළිය තෝරා ලියන්න.**

   i. වත්තල, උනුන්, රතුපුල්
   ii. පංචාංගය, ක්‍රිස්තෝත්පත්තිය, කම්මුල
   iii. අරුණෝදය, මැත, එන්නෑ
   iv. පුනරාවර්ජනය, ලෝකෝත්තර, හබරල

3. **දී ඇති පද දෙක ම නිවැරදි ව විසන්ධි කර ඇති පද පේළිය තෝරා ලියන්න.**

   i. විද්‍යායතනය, සමාන්තර - විද්‍යා+යතනය, සම+අන්තර
   ii. සීමාසන්න, ස්වර්ණාභරණ - සීමා+ආසන්න, ස්වර්ණ+ආභරණ
   iii. යනෙන, අතිශයෝක්ති - යන+එන, අතිශය+ඕක්ති
   iv. සුළැඟිල්ල, ප්‍රස්තාවෝචිත - සුළු+ඇඟිල්ල, ප්‍රස්තාව+ ඕචිත

4. **සන්ධි නොවූ පදයක් ඇති පද පේළිය තෝරා ලියන්න.**

   i. ඔවුනොවුන්, සුරඟන, පරමාර්ථ, ග්‍රාමෝදය
   ii. සහෝදර, පොත්පත්, වක්කඩ, ඉන්නල
   iii. ධර්මෝදය, ශාලාධිපති, අනිත්තෙක, ජනාධිපතිතුමා
   iv. කොළුවා, මලසුන, කරන්නෑ, ගනඳුර

5. **මුලින් දී ඇති සන්ධි විධියට අයත් නොවන පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.**

   i. ආදේශ සන්ධි - සමානාර්ථ, අමාත්‍යාංශය, දඬයම්, සිහිතිහ
   ii. ලෝප සන්ධි - මුනුපුරා, තරිඳු, නෙළුම්මල්, නළඟන
   iii. ආගම සන්ධි - මහියංගණ, කොටියෝ, නිරවුල්, හේතුවක්
   iv. ආරෝහණ සන්ධි - දවසෙත්, ඉනික්බිති, ඇතැමුන්, දැනුමැති

6. **ස්වරාදේශ සන්ධි විධියෙන් වන පද පමණක් ඇති පද පේළිය තෝරා ලියන්න**

   i. ගුරූපදේශ, ජාතිකානුරාගය, එන්නෑ, අලුද්දෙයක්
   ii. ශ්‍රවණාගාරය, කාලෝචිත, වනෞෂධ, දැත
   iii. දෙවුර, සෝපහාස, ස්වෝත්සාහ, හද්දවස
   iv. වීරෝදාර, මුලසුන, නොයෙක්, අරුණෝදය

7. **පෙළ පොතෙහි ඔබ මෙතෙක් උගත් පාඩම් ඇසුරෙන් හමු වූ සන්ධි පද දහයක් උපුටා පහත වගුව සම්පූර්ණ කරන්න.**

| සන්ධි පදය | විසන්ධි කළ පසු | සන්ධි වර්ගය |
|---|---|---|
| | | |